ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ **සන්නිවේදන දෙපාර්තමේන්තුව**

දිනය **2014 අප්‍රේල් 30**

**මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීම පිළිබඳ යාවත්කාලීන කිරීම: 2014 අප්‍රේල්**

මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියේ සතුටුදායක ප්‍රගතියක් 2014 අප්‍රේල් මාසය තුළදී අත්පත්කර ගන්නා ලදී. සියලුම බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ඒකාබද්ධවීම සහ මෙරට ආර්ථික කටයුතු වලට වැඩි වැඩියෙන් සම්බන්ධවීම පිළිබඳ තම පුළුල් යෝජනා භාරදෙන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන විසින් භාරදෙන ලද පුළුල් යෝජනා සමාලෝචනයට ලක්කළ අතර, එම සැලසුම් තවදුරටත් සාකච්ඡා කිරීම සඳහා අදාළ බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන සමඟ වෙන් වෙන්ව තවත් සාකච්ඡා වටයක් පැවැත්වීමට කටයුතු කරනු ඇත. බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන, කුඩා බැංකු නොවන මූල්‍ය ආයතන සමඟ ඒකාබද්ධවීමට හෝ අත්පත්කර ගැනීමට කැමැත්ත පළ කර ඇති අතර එලෙස හඳුනා ගන්නා ලද පාර්ශව සමඟ අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ සාකච්ඡා අරඹා ඇත. මෙම සාකච්ඡා වලට පහසුකම් සැලසීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව සතුව පවතින අදාළ බැංකු නොවන මූල්‍ය ආයතනයන්හි යථා තත්ත්ව පරීක්ෂණ සහ තක්සේරුකරණ වාර්තා අවශ්‍ය නෛතික ලියකියවිලි කටයුතු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, එලෙස කැමැත්ත පළ කර ඇති පාර්ශව වෙත නිකුත් කරන ලදී. බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන වලට නව ප්‍රාග්ධනය එක් කිරීමට උනන්දුවක් දක්වා ඇති උපක්‍රමික ආයෝජකයන් කිහිප දෙනෙකුම අදාළ බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන පිළිබඳ තම මූලික ඇගයීම් ආරම්භ කොට ඇත.

ඩීඑෆ්සීසී බැංකුව සහ නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ඒකාබද්ධවීමට අදාළ මූලික කටයුතුවල තවදුරටත් නිරත විය. මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී, එම්බීඑස්එල් සේවින්ග්ස් බැන්ක් ලිමිටඩ් සහ එම්සීඑස්එල් ෆිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ් යන ආයතන තනි බලපත්‍රලාභී මුදල් සමාගමක් පිහිටුවීමේ අපේක්ෂාවෙන් එම ආයතන තුන ඒකාබද්ධ කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. ඊට අමතරව, මූල්‍ය ආයතන

සමූහයන් තුළ ක්‍රියාත්මක වන බැංකු නොවන මූල්‍ය ආයතන කිහිපයකටම ඒකාබද්ධවීමේ ක්‍රියාවලියේ නියැලීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමැතිය ලබාදී ඇත.

ඒ අතරම, බැංකු නොවන මූල්‍ය ආයතනවල තොරතුරු පත්‍ර සහ යථා තත්ත්ව පරීක්ෂණ වාර්තා පිළියෙල කිරීමේ සහ තක්සේරුකරණ ක්‍රියාවලිය සඳහා පත්කර ඇති විගණන ආයතන විසින් එම ක්‍රියාවලිය මැයි මස පළමු සතිය තුළදී නිම කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. මූල්‍ය දත්ත මත පදනම් වූ මෙම වාර්තා, උනන්දුවක් දක්වන පාර්ශව සහ ඉලක්කගත බැංකු නොවන මූල්‍ය ආයතන අතර සාකච්ඡාවන් සඳහා පදනම සපයනු ඇත. ඒ අතරම, මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීම පිළිබඳ අයවැය යෝජනාව බලාත්මක කරමින් පාර්ලිමේන්තුව විසින් 2014 අංක 8 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත සහ 2014 අංක 7 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත ව්‍යවස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව, අදාළ පනත් මගින් අවශ්‍ය කෙරෙන පරිදි බදුකරණය පිළිබඳ මාර්ගෝපදේශයන් සම්පාදනය කිරීමේ කටයුතු අවසන් කරමින් සිටී. මෙම මාර්ගෝපදේශයන් මගින් මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීම සඳහා යෝජිත බදු දිරිගැන්වීම් සම්බන්ධයෙන් පැහැදිලි අදහසක් ලබාදෙනු ඇති අතර, ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ පාර්ශව තවදුරටත් දිරිගැන්වෙනු ඇත. මූල්‍ය අංශය ඒකාබද්ධවීමට සමගාමීව පැන නගින අභියෝගයන්ට මුහුණ දීමට හැකිවන පරිදි, බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා පවත්නා නියාමන රාමුව ශක්තිමත් කිරීම සඳහා එය සමාලෝචනය කිරීමේ කටයුතු ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආරම්භ කර තිබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විවිධ පාර්ශව විසින් ඉස්මතු කරන ලද ගැටළු සඳහා පැහැදිලි කිරීම් ලබාදෙන අතරතුර ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ සියලු පාර්ශවකරුවන් සමග අදහස් හුවමාරු කර ගැනීමෙහි තවදුරටත් නිරත විය. මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් බාහිර පාර්ශව විසින් මෙම මාසය තුළදී සංවිධානය කරන ලද සම්මන්ත්‍රණ ගණනාවකට ද අධිපතිතුමා සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු සහභාගි වූහ.